සී/ස මගනැගුම ඉමල්ෂන් නිෂ්පාදන (පුද්) සමාගම - 2017
-----------------------------------------------------------

සීමාසහිත මගනැගුම ඉමල්ෂන් නිෂ්පාදන (පුද්ගලික) සමාගමේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවාස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.

-----------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ (මණ්ඩලය) වගකීම වේ.

## 1.3 විගණනයේ වගකීම.

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයන් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මකව සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

-------------------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**02.** මූල්‍ය ප්‍රකාශන

**2.1** තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ **2.2** ඡේදයෙහි දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් **2017** දෙසැම්බර් **31** දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා මතය වේ.

**2.2** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**2.2.1** ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සමඟ අනුකූල වීම

මේ සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **2012** දෙසැම්බර් **31** දිනට සමාගම විසින් භාවිතා කරනු ලැබූ සම්පූර්ණයෙන්ම ක්ෂය වී අවසන්ව තිබූ වත්කම් පිරිවැය රු. **15,874,665** ක් විය. කෙසේ නමුත්, දේපළ පිරියත හා උපකරණ ගිණුම් ප්‍රමිත (ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත අංක - **16**) අනුව එම වත්කම් ප්‍රත්‍යාගණන කිරීමට හෝ ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස් වීම් සහ වැරදි ප්‍රමිතය (ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත අංක - **08**) අනුව නැවත දැක්වීමට අදාළ ක්‍රියාමාර්ග සමාගම විසින් ගෙන නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයට හා මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ සංකල්පනාත්මක රාමුවට පටහැනිව සමාගම සිය පොළී ආදායම් උපචිත පදනමෙන් බැහැරව මුදල් පදනම මත හඳුනා ගෙන ඇත. සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ පොළී ආදායම රු. **19,170,612** ක් විය. කෙසේ වෙතත්, ආයතනය උපචිත පදනම අනුව රු. **21,210,208** ක් පොලී ආදායම ලෙස හඳුනාගත යුතුය. එම හේතුවෙන් පොළී ආදායම රු. **2,039,596** කින් අඩුවෙන් පෙන්නුම් කරයි.

**2.2.2** ගිණුම්කරණ ප්‍රතිපත්ති.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන සටහන් අංක **2.13**(අ) හි හෙළිදරව් කර ඇති ක්‍රමයට පටහැනිව, සමාගම එක් එක් සේවකයාගේ මූලික වැටුප සේවා කාලයෙන් ගුණකර **2017** දෙසැම්බර් **31** දිනට පාරිතෝෂිත සඳහා වෙන් කිරීම් ගණනය කර ඇත.

**2.2.3** ගිණුම්කරණ අඩුපාඩු.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව **2017** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා ක්ෂය වීම් රු. **4,835,440** ක් විය. කෙසේ නමුත්, විගණනය විසින් සිදුකළ ගණනය කිරීම් වලට අනුව එය රු. **4,140,072** කි. එම හේතුවෙන් මෙම ශේෂයන් දෙක අතර රු. **695,367** ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ස්ථාවර තැන්පතු ශේෂය රු. **124,991,726** ක් විය. කෙසේ නමුත් බැංකුව විසින් තහවුරු කරන ලද එම ශේෂය රු. **125,657,433** කි. එම නිසා රු. **665,709** ක වෙනසක් මෙම ශේෂයන් දෙක අතර නිරීක්ෂණය විය.

(ඇ) සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනට මාර්ග සංවර්ධන අධිකාරියෙන් සමාගමට ලැබිය යුතු ශේෂය රු. 2,383,446 ක් විය. කෙසේ නමුත් මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලද තොරතුරු අනුව එකී ශේෂය රු. 2,053,192 කි. ඒ අනුව, රු. 330,317 ක වෙනසක් මෙම ශේෂයන් දෙක අතර නිරීක්ෂණය විය.

## 2.3 නීති,රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

| නීති,රීති /විධිවිධානවලට යොමුව | විස්තරය |
|---|---|
| (අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනත. | මෙම පනතට අනුව සමාගමේ විගණකවරයා විගණකාධිපති විය යුතුයි. සමාගම 2017 න් අවසන් වසර සඳහා මූල්‍ය ප්‍රකාශන 2021 පෙබරවාරි 18 වනතෙක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. කෙසේ වෙතත් මූල්‍ය ප්‍රකාශන සඳහා 2018 ජූලි 24 දින පැවැත් වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමෙන් අනුමැතිය ද හිමි වී තිබිණි. |
| (ආ) 2015 ජුනි 17 දිනැති අංක:PED / 3 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2.1 වගන්තිය. | චක්‍රලේඛයේ දක්වා ඇති සීමාවන්ට පටහැනිව සමාගමේ සභාපතිට සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන්ට එකතුව රු. 2,262,000 ක් මාසික දීමනාවක් සමාලෝචිත වර්ෂය තුළ වැඩිපුර ගෙවා ඇත. |
| (ඇ) 2015 මැයි 25 දිනැති අංක 01 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| • 3.1 වගන්තිය | චක්‍රලේඛයේ 31 වගන්තියට පටහැනිව හිමිකම් ලබන, සීමාව ඉක්මවා සමාගමේ නිලධාරීන් හට එකතුව රු. 730,080 ක් වූ ඉන්ධන දීමනාවක් සමාගම විසින් ගෙවා තිබුණි. |
| • 2016 ඔක්තෝබර් 27 දිනැති අංක 01 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.3 වගන්තිය. | චක්‍රලේඛයේ සීමාවන්ට පටහැනිව හිමිකම් ලබන සීමාව ඉක්මවා සමාගමේ නිලධාරීන් හට එකතුව රු. 1,740,000 ක් වූ වාහන හා ප්‍රවාහන දීමනාව 2017 වර්ෂය තුළ සමාගම ගෙවා තිබුණි. |

## 03. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 77,899,167 ක පාඩුවක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු. 598,107 ක් විය. ඒ අනුව, මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 78,497,274 ක පසුබෑමක් නිරීක්ෂණය විය. පෙර වසර හා සසඳන විට මෙහෙයුම් ආදායම සියයට 87 ක ප්‍රතිශතයකින් පහළ වැටීම මෙහෙයුම් ප්‍රතිඵලය අඩුවීමට ප්‍රධාන හේතුව වී ඇත.

### 3.2 අනුපාත විශ්ලේෂණය.

| | 2017 | 2016 |
|---|---|---|
| ජංගම වත්කම් අනුපාතය | 2 | 2.20 |
| ක්ෂණික වත්කම් අනුපාතය | 1.52 | 1.88 |
| දළ ලාභ අනුපාතය | (5.39%) | 25% |
| ශුද්ධ ලාභ අනුපාතය | (141.84%) | 0.14 |

ගණනය කරන ලද ජංගම වත්කම් අනුපාතය සහ ක්ෂණික වත්කම් අනුපාතය අනුව සමාලෝචිත වර්ෂයේ දී සහ ඉකුත් වර්ෂයේදී සමාගම පිළිගත හැකි මට්ටමකට එය පවත්වා ගෙන යනු ලැබ ඇති බව නිරීක්ෂණය විය.

දල ලාභ අනුපාතය සියයට 30 කින් අඩු වී ඇති අතර, ශුද්ධ ලාභ අනුපාතය සියයට 141 කින් පමණ අඩු වී ඇත. මෙලෙස සමාගමේ වාර්ෂික ලාභය පහත වැටීමට බලපෑ ප්‍රධාන හේතුවක් ලෙස පෙර වසරට සමගාමීව සමාලෝචිත වර්ෂයේ දී සමාගමේ ආදායම සියයට 87 ක ප්‍රතිශතයකින් අඩු වීම දැක්විය හැක.

## 04. ගිණුම්කටයුතුභාවය සහ යහ පාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම

2003 ජුනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වා දුන් රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.1.3 වගන්තිය ප්‍රකාරව, එක් එක් මූල්‍ය වර්ෂය ආරම්භ වීමට අවම වශයෙන් දින 15 කට පෙර යාවත්කාලීන කරන ලද සංයුක්ත සැලැස්ම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවත්, සමාගම එම චක්‍රලේඛයේ අදාළ විධිවිධාන වලට අනුකූලව කටයුතු කර නොමැත.

### 4.2 ක්‍රියාකාරී සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා සමාගම විසින් ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 4.3 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා අනුමත කරන ලද අයවැයක් සමාගම විසින් විගණනය වෙත ඉදිරිපත් කර නොමැත.

### 4.4 විගණන කමිටුව

මාර්ග සංවර්ධන අධිකාරිය සහ සමාගම රේඛීය අමාත්‍යාංශයේ එකඟතාවයෙන් විගණන සහ කළමනාකරණ කමිටුවත් ස්ථාපිත කිරීමට පියවර ගෙන නොතිබුණි.